ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

# පැරැළිය නැංගුරම් පලෙහි තිබෙන වැලි ඉවත්කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

## (ටෙන්ඩර් කොන්දේසි සම්බන්ධ සංශෝධනය)

### CFHC/SD/SAND/HIK /2021/40

01. පැරැළිය නැංගුරම් පලෙහි තිබෙන වැලි ඉවත්කිරීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් 2021.07.15 දින පස්වරු 2.00 දක්වා කැඳවනු ලැබේ.

02. ඉවත් කල යුතු වැලිකියුබ් ප්‍රමාණය 8063 වන අතර මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර සැපයුම් කළමණාකාර හමුවී අවශ්‍ය තොරතුරු විමසිය හැක.

03. අදාල මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා රු.1000.00 ක මුදලක් ගෙවීමෙන් ප්‍රධාන කාර්යාලයෙන් 2021/07/01 දින සිට 2021.07.14 දින පස්වරු 2.00 දක්වා ලබාගත හැක. මුදල් ගෙවීම කාර්යාලීය දිනයන්හි කාර්යාලීය වේලාව තුල (පෙරවරු 9.00 - පස්වරු 3.00 දක්වා) සිදුකළ හැක.

04. ලිඛිත අයදුම්පතක් යොමුකිරීමෙන් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකි අතර ගෙවීම් ක්‍රමය වන්නේ මුදලින් ගෙවීම වන අතර ඉහත කරුණට අදාළ ලංසු ලේඛන සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (www.cfhc.gov.lk) ලබාගත හැකිය. නැවත ගෙවනු නොලබන තැන්පතුව ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 1446 දරණ සංස්ථා ගිණුමට බැර කළ යුතු අතර ටෙන්ඩර් ලේඛනය සමග නැවත ගෙවනු නොලබන ගාස්තුවේ තැන්පතු පත්‍රිකා පිටපතක් ඉදිරිපත් කල යුතුය.

05. වැලි ඉවත්කිරීම සඳහා මාස 06 ක කාලයක් පමණක් ලබා දෙනු ලබන අතර ලක්ෂ 02ක බැදුම්කරයක් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කළයුතුය.

06 මිල ගණන් විවෘත කිරීම 2021.07.15 දින පස්වරු 2.00ට ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේදී සිදු කරන අතර එදින එම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ද සහභාගිවය හැක.

07 පැරැළිය නැංගුරම්පහෙි තිබෙන වැලි අප ආයතනය විසින් කැණීම්කර පටවා දෙනු ලබන අතර මිල ගණන් ඉදිරිපත් කරන විට වැලි කියුබ් එකක් සඳහා මිල ගණන්

පැහැදිලිව සඳහන් කල යුතු අතර ඉවත් කරනු ලබන වැලි කියුබ් ප්‍රමාණයද ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් කල යුතුය.

**08 ටෙන්ඩර්කරුවන් තෝරාගැනීමේදී කියුබ් එකක් සඳහා වැඩිම මිල ගණන් සඳහන් කල ටෙන්ඩර්කරු සහ ඉල්ලුම්කරනු ලබන වැලි කියුබ් ප්‍රමාණය පිළිබඳ සැලකිල්ලට ගනු ලැබේ.**

09 තෝරාගත් ටෙන්ඩර්කරු / ටෙන්ඩර්කරුවන් විසින් ප්‍රථමයෙන් මුළු මුදලින් 25% ක මුදල් පලමුව සංස්ථාවට ගෙවිය යුතුය.සංස්ථාවට ගෙවූ මුදල් ආපසු නොගෙවනු ලබයි.

10 වරාය නිර්දේශිත දොරටු අවසරපත්‍ර ගාස්තුවද ඔබ විසින් ගෙවිය යුතු අතර ධීවර වරායන්හි වැලි විකිණීමේදී අනුමත කරනු ලබන කොන්දේසි සඳහා එකග විය යුතුය.

11 වැලි ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය බලපත්‍ර භූවිද්‍යා හා පතල් කාර්යාංශය වෙතින් ඔබ විසින් ලබා ගත යුතුය . වැලි ප්‍රවාහනය කිරීමේදී ඒ සඳහා වන සියලු වගකීම් ඔබ වෙත පැවරෙන අතර සංස්ථාව මේ සඳහා වග කියනු නොලැබේ.

12 අවශ්‍ය වුවහොත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් ආයතනවල අවසරය ඔබ විසින් ලබාගත යුතුය.

13 මිළ ගණන් භාරගැනීම ප්‍රධානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සංස්ථාවේ කළමණාකාරිත්වය සතුය.

14 ඔබ ආයතනය විසින් වැලි ඉවත් කිරීමේදී එම ඉවත් කරනු ලබන වැලි කියුබ් ප්‍රමාණය පිළිබඳ අප ආයතනය විසින් මාසික ප්‍රගතිය පිළිබඳ විශේෂ අධීක්ෂණයක් සිදු කරනු ලබන අතර ඒ අනුව මාසිකව ඉවත් කල යුතු අවම වැලි කියුබ් ප්‍රමාණයද සැලකිල්ලට ගෙන ඔබ සමග ඇති කර ගනු ලබන ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ හෝ අවලංගු කිරීමේ පූර්ණ බලයද ආයතනයේ කළමණාකාරිත්වය සතුය.

සභාපති,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංකඃ 15,රොක්හවුස් පටුමග,
කොළඹ 15.